# ඔබ සැමට සුබ නව වසරක් වේවා!!!

## පිළිහුඩුවී

ළිඳ ගාව
හැල හොල්මනක් නැති
දිරා යන කොටයකි.

සිහසුන ය ඒ

එ මත
ඇ·

රැළි නාහාලා ඉහ වට
හැඳ හිරට
නීල ඔසරිය
හිඳී ඇ
ඇස් ඔබා
ළිඳ තුළ
හැල හොල්මනක් නැත
ළිඳ වට ..........

බොර ය ළිඳ
අඳුරු ය
මසුන් ඉල්පී මොර දෙන
"හැමදම
මෙහෙම ඉන්නේ
කොහොමද?"

**මංජුල වෙඩිවර්ධන**

පහන් වැට
තුළට විත්
දල්වන්න
පහනක්
හුදිලෙන්න
කවියක්ට
නුඹේ
සිතුවිලි
සයුරෙන්




හෙට දින
වඩාත්
සරු කර
ගනු වස්,
අපි ඔබට
මෙහි
ඉඩ
සදන්නෙමු.

සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

## නව වසරේ උදාව

වසරක් ගෙවී නව වසරක් ලබන විට
බාධක කම්කටොළු මැඩ ගෙන ඉදිරියට
යන්නට වරම් ලැබ දිරි ගෙන දිවි මගට
සුබ සෙත සැදේවා! නව වසරේ සැමට

හිරු දුටු කඳෝපැණියෙකු සැඟවෙන විලසින්
අපල විපත් වින බන්ධන දුරු කරමින්
සව්සිරියෙන් පිරි ලොවකට මග පතමින්
නව වසරක් උදා වේවා සිත සදමින්

සාමය සමාදානය ලොව පැතිරේවා
නිදුක් නිරෝගිව සව් සත වැජඹේවා
කරුණා දයා මුදු යහගුණ වැඩි වේවා
ලොව හැම සතුන් තුන් සරණෙන් රැක දේවා

ආර්ථිකය දින දින දියුණු ම වේවා
සමාජීය සහජීවන වැඩි වේවා
පාලන තන්ත්‍රයේ ගැටුමන් දුරු වේවා
යුධ බිය තුරන් වී සහනය සැලසේවා

එකිනෙක අතර ඇති බිය සැක නැති වේවා
සන්සුන් මනසකින් ලොව සුවපත් වේවා
මනුසත් බවේ යහගුණ දම් වැඩි වේවා
සාධාරණව යුක්තිය ඉස්මතු වේවා

ගිනි ගත් සිත් තුලට සිසිලසක් ඇති වේවා
සැනසිලි සිතින් ගුණ දහමට යොමු වේවා
අවුල් තැවුල් දුක් දොම්නස් දුරු වේවා
සැම ලෝ දනට සාමයේ මල් පිබිදේවා

**සෙනෙහෙලතා රත්නායක**

## අපි අපේම නුනත්

සිතුවිළි උයනම පාළු කළ දමා
සෙනෙහෙ පිදූ සිත තලා දමා
පුන් කළ සේ රන් සිළු නිවා දමා
කිම නිහඬව සමු ගත්තේ
සුසුමත් කඳුළත් මට තියලා

තුන් හිතකින්වත් නැත වරදක් කරලා
සෝ සංකා නැත ඔබ හද තලලා
රිදුමත් ඉකිබිඳුමත් මා හට දීලා
හිනැහෙන්න පෙරදා මෙන් හසරැල් පාලා

සුවඳයි සත්තයි මගේ සිතත්
නොසැලෙයි නොමැකෙයි ඔබේ රුවත්
හිම ගිරයේ ගිරි ශිඛර ලෙසින්
අනවතප්ත විල කුසුම ලෙසින්
තවමත් ආදරෙයි කියා මුමුණමින්
අපි අපේම නුනත්
සදා රැඳෙන්න මසිතේ
හද්‍ර තටාකයෙ පියුම ලෙසින්..

**කාන්ති වික්‍රමසූරිය**

## තවත් නව වසරක්

පිපිරුම් - යුධගිනි - ලේ - කඳුළු
සන්තාප - දුගී දුප්පත්කම් - සෝසුසුම් වැනි
සාපලද දෑම හමුවන රුදු ලොවේ
ලතෙත් සිත් පතුල් මත පැනනැගී
දිවි කතර මැද වැඩී හෙවණ දෙන
උණ පඳුරු මත ඉතින් මේ
මල් පිපෙන කාලයයි....
ඒ නමුත්, නොනැසී තව වැඩෙන්නට
අවැසි කල මෙකල මැයි මුමුණමින්
අලුත් සිතිවිල්ලකින් සිසිල ගෙන
පුපුරු ගසනා සිත් පතුල් පිරිමැද
ජීවිතය සිසාරා
හමායන්නට ආ සුළඟකි...

**විද්‍යානි මනතුංග**

## ගලන ගඟකි ජීවිතේ

ගලන ගඟකි ජීවිතේ
දයාලු ලෝකයේ.

කොයි තරම් හොඳද
අපිට පුළුවන් නම්
මේ ගලන ගඟ
ආපහු හරවන්න.

මැරෙන්නට පෙර
ඉස්සර වගේ
ඇත්තටම
සන්තෝසෙන් ඉන්න.

**ශ්‍රියානි පෙරේරා**

## පොඩි දෝණිට ඔවදනක්

රන් සමනළ තටු දැමූ පත් ඉරු තුළ
පෙම් හසුනක් කවිදෝ දමලා
සමනළ සිහිනය බොඳ වී ගොස්
සිත පෙම් සිතුවිල්ලෙන් ඔකඳ වෙලා

රන්කිරි තොළ ගෑ ළපටි දෙතොල් මත
මල් හසරැල්ලක් මෝදු වෙලා
මව් උකුලේ උන් පුංචි කුමාරිට
ඉගිලී යන්නට තටු ලැබිලා

ළපටි වැඩියි ඔබ ඉගිලෙන්නට තව
ආකාසේ හිරු එළිය සැඩයි
පුංචි නුඹෙ තටු සිඳලන්නට
වියරු සියොත් කැල මාන බලයි

එපා දුවේ සිත් වියරු වැටෙන්නට
අනාගතේ නුඹලට බාරයි
තටු සිඳුනෝතින් ඉගිලෙනු බැරි වී
ජීවිතයම අඳුරට බාරයි



**ජයවතී කාරියවසම්**

## අහසත් තරහා වෙලා අද

අහස තරහා වී
තරු සඟවා ගෙන
කළු වළා පෙළ
සඳු වසා ගෙන
මැදියමත් පසු වී
මා නිදි නැතිව
දැවටෙමි
දුරකථනය ළඟ

ඇයි ද මා හිමි
කතා නොකළේ තවමත්

රන්මසු ගෙනෙන්නට
එතෙර ගිය හිමි
මංමුලා වී ද
කොන්ක්‍රීට් වනයේ
ප්ලාස්ටික් මල්
රුවට රැවටී

නොමනා ගමන් ගොස්
අන්තර්ජාලයේ
චාටු චැට් බසට රැවටී
සයිබර් සුන්දරියන්ගේ
මා අමතක වී ද හිමියනි

ඇයි ද හිමියනි
මා නොම ඇමතුයේ තවමත් ......

**නිහාල් රූපසිංහ**

## මා කවි ලියන්නේ ඇයි?

ඔබ කවි ලියන්නේ ඇයි?
කවුරුදෝ මගෙන් ඇසුවා
පත්තර පිටු පුරවන්නද?
නෑ..නෑ
පොතක් සේ එලි දක්වන්නද?
නෑ..නෑ
අනුන්ට කියවන්න දෙන්නද?
නෑ...නෑ
මම ම කියවා රස විඳින්නද?
වෙන්නැති
මං කවුද කියා අඳුනා ගන්නද?
ඔව්........ඔව්!

**වර්ණ රසිකා ඒකනායක.**



## අහෝ! හැම් බේකන්

පහළ මධ්‍යම පංතිකයාගේ
මාස් පඩියට
බොහෝ ඉහළින්
වැජඹුන
සුපිරි ආහාරයක් විය
එ දවස

පිරිහෙන සෞඛ්‍යයට
වඩාත් අහිතකර වූ
හෘද රෝගියාට
තහනම් ආහාරයක් විය

මෙ දවස

**සුභාෂිණී හේරත්**
ඇට්වුඩ්

## දුරැත්තේ මතකයක්

ඇඟ කිති කවාලන සීතල දුරුතු මසේ
වතු සුදු මලේ පැහැගත් රෙද්දකි මේසේ
තාලෙට රඟන සිළුවයි පොල්තෙල් පහනේ
කිරිබත් පිඟානට ආලෝකය දුන්නේ

තෙරුවන් නමැද බුදු හිමි සඳු සිහි කරලා
නළලත තබා මව් පිය පා පිස දමලා
කිරිකොත් පාට ගත් ගවුමින් සැරසීලා
මතකෙට නැගේ පාසැල් දිවි ඇරඹූ දා

**කමලිකා ගුණරත්න**

## හිනිදුම සහ දියලුම

හිනිදුම ඇල්ල හරි සුන්දර මැවීමකී
මුදුනින් වැටෙන දිය පා මුල මීදුමකී
දුටු හැම විටම හැර දා යාමට නොහැකී
මට කඳුරට දි හමු වූ මහා විශ්මයකී

දියලුම මනහරයි වෙනසයි නැත දෙවැනී
හෝ හඬ නගයි සමුදුර කඳුරට පැමිණී
කෝමල රඟන සුදු දිය රැළි ඇද හැලුනී
ඇඹරෙන යුවතියක ලෙස මගෙ සිත රැඳුණී

**ස්ටීවන් පෙරේරා**

කියවන්න... ලියන්න...
තොරතුරු දැන ගන්න..
www.ketapathpawra.com
වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත්
කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.